ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත

LP - QD / 52/ News/ 2013

ක්‍රි. ව. 2013 මැයි 13 සඳුදා
05 වෙළුම - 27 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00

# ළමා ප්‍රදීපය



## මේ කුමරි මරියාවන්ට කැප කළ මල් මාසයයි !

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# ළමා ලෝකයේ සුරතල් අත්දැකීම්

## ආදරණීය දුවේ පුතේ...

''ළමා ප්‍රදීපය ' අද මේ පිටුවෙන් ඔබට කථා කරන්න යන්නේ ඔබේම ජීවිතයට සුවිශේෂි තවත් විශේෂිත අත්දැකීම් සමුදායක් පිළිබඳවයි. ළමා ලෝකය හරිම සුන්දරයි. ඒ සුන්දර අත්දැකීම් මධ්‍යයේ ළමා ක්‍රීඩාත් හරිම චමත්කාර ජනකයි. ඒ ළමා ක්‍රීඩා හා බැඳුනු ළමා ජන ගීතත් හරිම ප්‍රියංකරයි. ඒ ළමා ජන ගීත මුල් කොට සැදුන ළමා සාහිත්‍යයත් හරිම ඉහළයි.

ආදර දුවේ පුතේ, ළමා සාහිත්‍ය පිළිබඳව කථා කරන විට අපේ මතකයට නැගෙන සුවිශේෂි නම් කිහිපයක්ම තිබෙනවා. කුමාරතුංග මුනිදාස , ආනන්ද රාජකරුණා, ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ, එස් මහින්ද හිමි ආදීන් ළමා සාහිත්‍යය දියුණු කරන්නට ඉමහත් උත්සහයක් ගෙන තිබෙනවා. ළමා ලෝකයේ ගීත සාහිත්‍යයත් සමඟ ළමා ක්‍රීඩා භූමිකාව පිළිබඳවත් අනිවාර්යයෙන්ම සිත් යොමු කළ යුතුයි. පෙර කල අතීතයේ අපේ ගැමි ගෙදර ළමා ලපටීන් අතර ළමා ක්‍රීඩා අතිශයින් වැදගත් තැනක් ගෙන තිබුනි. එය හරිම සුන්දර අත්දැකීමක් . සාමුහික ප්‍රයත්නයක අපූරු බැඳීමක්. සමහර විට පාසල් පෙළ පොත් වලත් භාෂාව මුල් කොට ගෙන ළමා සාහිත්‍යයේ සමහර ගීත හා ජන කවි දැක ගන්නට පුළුවන්. ඒත් අද ළමුන් එකට එක්ව ඒවා අත් විඳිනවාද යන්න නම් ටිකක් සැක සහිතයි.

ආදර දුවේ පුතේ, ඔබ අදත් ඔට්ටු සෙල්ලම් නම් කරනවා නේද? ඉස්සර අත් දැකීම් එක්ක මේ ඔට්ටු සෙල්ලම් කරන විටත් ළමුන් ලස්සනට ජන ගී , කවි භාවිත කළා. බලන්න ඔට්ටු සෙල්ලමට උචිතවම ගැලපුන පහත සඳහන් ගී කවි පේළී

අත්තාපල් මුත්තාපල් මා අල්ලන්නට බැරුවා
අත්තාපල් මුත්තාපල් රෑ වන තුරු අල්ලාපන්
අත්තාපල් මුත්තාපල් රන ගලේ ගල කෙටුවත්
මා අල්ලන්නට බැරියෝ

ගැමි වහරේ ජන ආභාෂය හොඳටම කා වැදුනු මේ ගී කාණ්ඩය සමහර විට ඔබෙන් සමහරකට හුරු පුරුදු ඇති. ''ඔට්ටු සෙල්ලමට'' මෙය යොදා ගන්නවා ඇති. මේ ජන කවි ක්‍රීඩා භූමිකාවේ තවත් සුන්දර තැනක් බව කදිමට පෙනෙනවා.

ආදර දුවේ පුතේ, දැන් ළමා ජන ගීය හා සබැඳුන තවත් සුලබ ක්‍රීඩාවක් ගැනයි කතා කරන්නේ. ඔබ පේළී ගැසී ඉදිරියෙන් ඉරක් ගසලා '' දිය හා ගොඩ ' ලෙසින් සලකා ක්‍රමයෙන් මේ වචන උච්චාරණය කරමින් පනින විට ක්‍රමය වැරදි වුවහොත් දැවී යනවා.

කං කං බූරු සං සං නෝරු - මං කියන දේ අහනවද ඔච්
එහෙනම් දුවල දුවලා ගිහිල්ලා ... - අල්ලා අරන් වරෙන්

ආදර දුවේ පුතේ, අදත් ගම් බද පළාත් වල ගැහැනු පිරිමි දෙපක්ෂයම එකට එක් වී කරන තවත් ළමා ක්‍රීඩාවක් හැටියට එළුකොට බැඳීම පෙන්වා දෙන්න පුළුවන්. මේ ක්‍රීඩාව කරන කොට හරිම සුන්දර රටා ඉරියව්වක් ගෙන එනු ලබනවා. අත් වැල් අල්ලාගෙන රවුමට ළමුන් පිරිස පෙළ ගැසී ඉන්න විට එක් ළමයෙක් පමණක් රවුම මැදට එනවා නේද?. ක්‍රීඩාව ඔබට මතකනේ? තවත් නව දෙනෙකු කවයෙන් පිටත ඉඳ එළුවා සෙවීමට පටන් ගන්නවා. දැන් මෙතැන ඇතිවෙන්නේ සංවාදයක්. එළුවා සෙවීමේ සංවාදව සමඟ ඇති වන ලා ලිත්‍ය තුළ කාව්‍යමය රසයකුත් ජනනය වෙනවා.

''මේ වැල මොකදෝ - මේ වැල දම්වැල
මේ වැල මොකදෝ - මේ වැල කිරි වැල
උඩින් පනින් - තල්ල කැඩෙයි
යටින් රිංගන් - තිබොල් ඇනෙයි''

රවුමට ගමන් කරමින් විශේෂයෙන් කුඩා ගැහැනු දරුවන් මෙය රඟ දක්වන විට අපූරු නාට්‍ය විලාසයකුත් නැටුම් ස්වරූපයකුත් ඉස්මතු වෙනවා. අත් දෙක කැඩීමට ගන්නා උත්සහය තුළ ඇතිවන ලාලිත්‍යය දරුවන්ගේ සුමට අහිංසකත්වය මතු කරවනවා. තවත් අපූරු ප්‍රශ්න, උත්තර කාව්‍යමය ළමා ක්‍රීඩාවක් තිබෙනවා. අපේ වැඩිහිටි අය තමන්ගේ කුඩා සංධියේදී අනිවාර්යයෙන්ම මේ ක්‍රීඩාවට සම්බන්ධ වී සිටි අයුරු තවමත් සිහිපත් කරනවා. දැන් මේ කවිය මතක් කරන විට පුංචි ඔබටත් එය අනිවාර්යයෙන්ම මතක් වෙයි. මෙන්න බලන්න ඒ අපූරු සුන්දර පැන හා පිළිතුරු ළමා ජන වහරේ ගීතය.

මේ පුටු කාගේ - බණ්ඩාරේ
මේ ඇඳ කාගේ - බණ්ඩාරේ
කුරුළු කූඩු කැඩු දුටින් - අපි දුටු කූඩුවක් නැති
ගේ ගොම ලාගත් මගෙ එළුවා - තොපට කොයින්දෝ අපගේ එළුවා
ඉරගල දීලා ගත් මගේ එළුවා - තොපට කොයින්දෝ අපගේ එළුවා
අප්පා දීලා ගත් මගෙ එළුවා - තොපට කොයින්දෝ අපගේ එළුවා
එළුවන් කන්නයි මං ආවේ - එළුබෙටි කාපං තුං තීරේ
සාවුන් කන්නයි මං ආවේ - ඒ බෙටි කාපං තුං තීරේ
එළුවා කපා අපේ ගෙටයි - ඒ බඩවැල් තොපේ ගෙටයි
මුවා කපා අපේ ගෙටයි - ඒ බඩවැල් තොපේ ගෙටයි
කොච්චි කොටන්නං රාළහාමි දෙනවාද එළුවා
කොච්චර කෙටුවත් නොදෙනෙමු අපගේ එළුවා
කැලේ දුවන්නං රාළහාමි දෙනවද එළුවා
කොච්චර දිව්වත් නොදෙනෙමු අපගේ එළුවා
දණින් වැටෙන්නම් රාළහාමි දෙනවද එළුවා
කොච්චර වැටුනත් නොදෙනෙමු අපගේ එළුවා
මෙන්න වැන්ද රාළහාමි දෙනවද එළුවා
කොච්චර වැන්දත් නොදෙනෙමු අපගේ එළුවා

(උපුටා ගැනීම - හෙළගොස)

ඉතිං දුවේ පුතේ, ලබන සතියේ මේ පිටුවෙන් තවත් ළමා ලොවේ ජන කවි හා ආශ්‍රිත ක්‍රීඩා පිළිබඳව ඔබේ මතකය අලුත් කරන්න උත්සහ කරන්නම්

**ඔබට ජේසු පිහිටයි.**

සංස්කාරක

ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා

# පුද්ගලකාරක නිකුත් කිරීම

## මුද්දර ලෝකය



## හඳුනා ගනිමු

පුද්ගලකාරක නිකුත් කිරීම් **personalized issue** ලංකා මුද්දර ඉතිහාසයට එක්වූ නවාංග යකි. ලංකා බැංකුවේ 70 වන සංවත්සරය නිමිත්තෙන් රු. 5 00 ක වටිනාකමින් යුක්තවූ මෙම ඓතිහාසික අංක එක ලෙස සැලකිය හැකි මුද්දරය2009 අගෝස්තු 3 වන දින නිකුත්විය.

දිවයිනේ ක්‍රියාත්මකවන වානිජ බැංකු හා රක්ෂණ කටයුතු සොයා බැලීමට කොමිසමක් පත් කළ යුතු බවට එවකට රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මන්ත්‍රීධුරයක් හෙබවූ ජෝර්ජ් ඊ.ද සිල්වා මහතා 1932 නොවැම්බර් 25 වන දින ගෙනෙන ලද යෝජනාව 1933 ජුලි මාසයේ රාජ්‍ය මන්ත්‍රණ සභාව විසින් පිලිගැනීමෙන් අනතුරුව 1934 අප්‍රේල් මාසයේ 24 වන දින ලංකා බැංකු කොමිසන් සභාව පත්කරන ලදී.

1935 පෙබරවාරි 28 වන දින රාජ්‍ය මන්ත්‍රණ සභාවේදී විවාදයට ගෙන 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත යටතේ රාජ්‍ය අනුග්‍රහය ලබන බැංකුවක් ලෙස 1939 අගෝස්තු මස 01 වන දින ලංකා බැංකුව ස්ථාපිත කරන ලදී.

මෙලෙස ආරම්භ කළ ලංකා බැංකුව 2009 අගෝස්තු 01 වන දින පුරා දශක හතක සිය අභිමානවත් ගමන් මග සැමරුවාය. එය අද ''ජාතියේ මහා පහන් ටැඹ '' ලෙස කිරුළ පළඳන්නීය.

ලා නිල් පැහැති මෙම මුද්දරයේ පසුබිමින් පැරණි ලංකා බැංකු ගොඩනැගිල්ලේ අඳුරු පැහැගත් අනුරුව ඉදිරියේ පහන් ටැඹක්වන් යෝධ ලංකා බැංකු ගොඩනැගිල්ලේ රුව ඊධක ලාංඡනයත් මගින් හැඩගැන්වේ.

දැනට පුද්ගලකාරක නිකුත් කිරීමේ කාණ්ඩයෙන් එළිදක්වා ඇති ලංකාවේ එකම හා ප්‍රථම මුද්දරය වන්නේ මෙයයි.




***පුද්ගලකාරක නිකුත් කිරීම් ලංකා මුද්දර ඉතිහාසයට එක්වූ නවාංගයකි. ලංකා බැංකුවේ 70 වන සංවත්සරය නිමිත්තෙන් රු. 5 ක වටිනාකමින් යුක්තවූ මෙම ඓතිහාසික අංක එක ලෙස සැලකිය හැකි මුද්දරය 2009 අගෝස්තු 3 වන දින නිකුත්විය.***

මෙම මුද්දර කාන්ඩයේ මුද්‍රණය කර ඇති ප්‍රමාණය මුද්දර 3,000,000 කට සීමාවී ඇති අතර එය අළෙවිය සඳහා දී ඇති අවසන් දිනය 2010-08-02 වන බැවින් මෙම මුද්දරය ලංකාව තුළ කිසිම තැපැල් හළකින් අද ඔබට මිලදී ගැනීමට ලැබෙන්නේ නැත. (එය දැනට කල් ඉකුත්වී ඇත. දුකයි - ඒත් ඇත්තයි

✍ සිරිල් පෙරේරා

## බටගම සා. අන්තෝනි දහම් ළමුන්ව දැනුම්වත් කිරීමක්.

බටගම සා. අන්තෝනි දහම් පාසලේ 11 ශ්‍රේණියේ සිසුන් වෙනුවෙන් මීසමේ තරුණ ක්‍රිස්තියානි ශිෂ්‍ය ව්‍යාපාරයේ සාමාජිකයන් විසින් සංවිධානය කරනු ලැබූ '' මතට තිත'' වැඩ සටහනක් පසුගියදා මීසම් ශාලාවේදී පැවැත්වුණි. බටගම මීසම් සේවක ගරු බර්නාඩ් නිශාන් විලත්ගමුව පියතුමාගේ සහයෝගය හා අනුදැනුම යටතේ මත්පැන් හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය ( ADIC ) මගින් මෙය මෙහෙයවූහ. මේ සඳහා දහම් පාසල් ආචාර්ය මඬුල්ලද සහභාගි විය.

රොනාලි බෙත්තිලියෝන්

# 2013 වසරේ පැවැත්වූ ( ජනවාරි - අප්‍රේල් ) ළමා ලේඛක වැඩමුළුවන් හි සාර්ථක නිර්මාණයන්

## දීර්ඝායු වේවා



සැඩ පහර මැද ජීවිත ගමන යාමට
අප මෙහෙය වනා ගුරු මව්නි
ගුරු පියවරුනි ඔබ සැමට දීර්ඝායු වේවා.

**මිනෝෂි රසාංගි** - 10 ශ්‍රේණිය
සින්දාත්‍රියා දහම් පාසල - (වයික්කාල මීසම)

## මව් සෙනෙහස



දස මසක් කුසේ හෙවූ මගෙ අම්මා
ආදරයෙන් ඇති දැඩි කළ මගෙ අම්මා
සෙනෙහස් බසින් අප අමතන අම්මා
අඳුරු ලොවේ මිණි පහනයි ඔබ අම්මා

**ටෙෂිනා මිරැන්ඩා**
08 ශ්‍රේණිය - කිතු දහම් පාසල - පල්ලන්සේන

## සිරිලක් මව්නි

ඉන්දු සයුරේ මුතු ඇටය ලෙස නම් ලබමිනා
පෙරදිග ධාන්‍යාගාරය ලෙස විරුදාවලි ලබමිනා
මුළු මිහිතලයේ රැජිනක් ලෙස කිරුළු හොබවමිනා
සිරි ලක් මවුනී ඔබ පාමුල අප රැකෙනා

**නිරාෂා සාවින්දි මොරායස්** - 09 ශ්‍රේණිය
සාන්ත අන්තෝනි දහම් පාසල - බටගම

## සැඳෑ සිරිය

හිරු අවරට බැස යන්නේ
මුළු අහසම කළු වන්නේ
කුරුලු රංචු ඉගිලී යන්නේ
සවසයි මෙලෙසින් එන්නේ

**සංජීවනී ඩිල්රුක්ෂි** - 10 ශ්‍රේණිය
ලූර්දු දේවමාතා දහම් පාසල - පොල්ගහවෙල

## විදුහල්පති මෑණියෙනි

අහස් ගැබ නම් වූ පාසල් මාතාවගේ පායා
දිදුලන ගුරු මවුපියන් සහ පියවරුන් අතරේ
බැබලෙමින් ලොවම එළිය කළ විදුහල්පති
මෑණියේ ඔබයි මගේ පාසල් අම්මා.

**ෂෙහාරා දුල්මිණි** - 06 ශ්‍රේණිය
සාන්ත අන්තෝනි දහම් පාසල - කිරාගාර
(ගෝනවිල මීසම)

## උදයක අසිරිය

කුරුළුන් සැම තැන පියඹන්නේ
මිහිරි කටහඬින් ගයමින්නේ
ඒ කන්කළු හඬ කන වැකුනේ
ප්‍රබෝධයෙන් අපි දිවයන්නේ

**ශහේනි අනෝද්‍යා** - 09 ශ්‍රේණිය
සදාසරණ දේවමාතා දහම් පාසල - බලගල

## පැව්දි දිවිය



ජීවිතේ දුක් කම්කටොළු මැද
සිනාසෙමි මේ දිවිමගේ
කිසිම කෙනෙකුට නොපෙනෙනා සේ
විඳ ගතිමි දුක සතුට සේ.
යම් දිනක මා එනතුරු ඔබ
බලා සිටිනා බව මම දනිමි සමිඳුනේ
එදින එනතුරු ඇඟිලි ගනිමින්
මම බලා සිටින්නෙමි මගේ ජේසුනි....

**දේවිකා කුමුදිනි පෙරේරා**
11 ශ්‍රේණිය
කටුකුරුන්ද දහම් පාසල - (කලමුල්ල මීසම)

# ලේඛන කලාව කියාදෙමින් ළමා ලේඛක වැඩමුළු 50 ක් පැවැත්වීම අගයමු !

**වර්තමානයේ විද්‍යාව හා තාක්ෂණවේදයේ ඇති දියුණුවත් සමග ළමුන් තුළින් පොත පත කියවීමට ලිවීමට ඇති උනන්දුව ඇත් වී යාම අපට සුලභව දැකිය හැකිය.**

එවැනි යුගයක ළමා ලේඛකයින් සොයමින් ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතා විසින් මෙහෙය වනු ලබන ළමා ලේඛක වැඩමුළු ඉතා වටිනා වැඩ සටහනකි. පසුගියදා ඔහු විසින් මෙම වැඩමුළු මාලාවේ 50 වැනි ළමා ලේඛක වැඩමුළුව පැවැත්වූ බව ළමා ප්‍රදීපයෙහි දැක්විණි. මොහු විසින් කොළඹ, හලාවත, කුරුණෑගල, රත්නපුර, මහනුවර , අනුරාධපුර, බදුල්ල යන පදවි වල වැඩමුළු 75 ක් මෙහෙයවා ඇත. මෙහිදී ශිෂ්‍යනායක, යොවුන් ලේඛක , සංස්කාරක , ජනසන්නිවේදන, ජීවිතාවබෝධ , පුවත්පත් කලාව ආදි වැඩමුළු හා පාසල් වියේ යෞවන යෞවනියන් සඳහා මාධ්‍ය වැඩසටහනක් ද පවත්වා ඇත.

මේ වැඩසටහන් මාලාවේ මා දකින එක් විශේෂත්වයක් ඇත. එනම් ළමා ලේඛක වැඩමුළු අවසානයේදී අභ්‍යාසයක් දි ජයගනු ලබන ළමුන්ගේ නිර්මාණ ළමා ප්‍රදීපයෙහි පළ කිරීමය. මෙලෙස මේ ආකාරයෙන් තමාගේ නිර්මාණයන් පුවත්පතින් දකින්නට සැළැස්වීම තුළින් ළමයාව තව තවත් නිර්මාණකරණයට වැඩි වැඩියෙන් පොළඹවා ගැනීමට කුමර නයනජිත් මහතා සුක්ෂම වී ඇති බව පෙනී යයි. ඔහු මේ ආකාරයට ක්‍රියා කිරීම තුළින් ඉදිරි අනාගතයේදී ගරු ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමා, ගරු අර්නස්ට් පෝරුතොට පියතුමා , වැනි දක්ෂ ලේඛක ලේඛිකාවන් රාශියක් බිහිවීම කිසිවකු හට නොවැළක් විය හැක. ළමා ලේඛක වැඩමුළු 50 ක් මෙහෙයවූ මෙතුමාට සුබ පතන අතර ශ්‍රී ලාංකීය දරු දැරියන්ගේ ලේඛක දිවියේ ''අ'' යනු ''ආ'' යනු කියා දීම තුළින් ලේඛන කලාවේ නෙත් පෑදීමට අවශ්‍ය ශක්තිය ලැබේවායි පතමි.

**ලක්ශාන් ප්‍රනාන්දු**
සාන්ත ජෝශප් නි.ම.නි දෙව්සත්හල
කොහුවල

## ජේසුනී



ඔබ මට තරුවකි
සඳුරු රැයෙහි සුදිලෙන
අඹර පුරා .....
ළා හිරු මඬලයි මා අබියස ඔබ
බැස යන්නේ නැත
මඳ පවනයි ඔබ
මා හද සනසන
දුක් ගිනි දහරා මැවෙනා තුරා
නිති සරණයි
මා හට දෙව් සමිඳේ ඔබ
මාගේ මුළු ජීවිතය පුරා

**ඈන් දිනේෂිකා පෙරේරා**
13 කලා අංශය
සිරිකුරුස විදුහල - ගම්පහ



**මාසික සිතිවිල්ල**
"මැයි මාසය"
ළමා ප්‍රදීපය,
අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය
මාවත,
කොළඹ 08.

**අප්‍රේල් මාසය**
**මාසික සිතුවිල්ල**
**ජයග්‍රාහී නිර්මාණය**



සුරතල් පෙන්වමින්
ළමා විය ගත කරන
රුව නම් ඔබේ
වතුසුදු මලක් මෙනි
මදහස පාන්නේ මුකුලිත මලක් වැනි
මල් අතරේ මලක් වෙන්න මතු ලොව ජයගන්න

**හිරුණි රන්සිකා මල්ශණී**
9 ශ්‍රේණිය
ශාන්ත ඉසිදෝර් දහම් පාසල - තිබ්බටුගොඩ

# 2013 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

## පළමු තේමාව ඇසුරෙන් පළවු ප්‍රශ්න වලට පිළිතුරු (ප්‍රශ්න අංක 66 සිට 71 දක්වා පිළිතුරු)

66. ⋆ මරියාවන්ගේ උදාන ගීතය (ලූක් 1/46-55)
⋆ සෙකරියස්ගේ ප්‍රශංසා ගීතය (ලූක් 1 / 67 - 79 )
⋆ සිමියොන්තුමාගේ ගීතය (ලූක් 2 / 29 - 32)

67. ආරම්භයේදී ධර්මයාණෝ සිටිසේක.
⋆ ධර්මයාණෝ දෙවියන් වහන්සේ සමඟ සිටි සේක.
⋆ ධර්මයාණෝ දෙවියන් වහන්සේවම සිටි සේක.
(ජොහාන් 1/1)

68. ස්නාවක ජොහාන්ගේ පියාවු සෙකරියස්

69. ⋆ ස්වර්ගය විවෘත වීම (ලූක් 3 / 21)
● පාපය නිසා වැසී තිබුණු ස්වර්ගය ක්‍රිස්තුන් වහන්සේ මගින් විවෘත වූ බව.

⋆ ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝය. ඔබ කෙරෙහි ඉතා ප්‍රසන්න වී සිටිමි. (ලූක් 3 / 22)
● දේව පුත්‍රයාවු ජේසුස් වහන්සේ කෙරෙහි සම්පූර්ණ විශ්වාසය තබන්න.

⋆ ශුද්ධාත්මයාණන් ප්‍රකාශ වීම - ශුද්ධාත්මයාණෝ පරවියකුගේ රූපාකාරයෙන් (ලූක් 3/ 22)
● මිනිස් ශරීරය ශුද්ධාත්මයාණන් වැඩවසන දේව මන්දිරයකි.

71.
1. ⋆ ශුද්ධවු මතෙව්තුමා - කන්ද උඩ දේශනය
⋆ ශුද්ධවු ලූක් තුමා - තැනිතලාවේ දේශනය

2. ⋆ තෘප්තිමත්ව සිටීම
⋆ දෙවියන් වහන්සේ දර්ශනය කිරීම
⋆ ජේසුස් වහන්සේ වෙනුවෙන් සම්පූර්ණයෙන් කැපවී සිටීම

3. සත්‍යයට , යුක්තියට සාක්ෂි දැරීම

සමාජය තුළදී අසාධාරණයක්, බොරුවක් , වංචාවක් සිදුවනු දුටු විට නිශ්ශබ්දව නොසිට ඒ අසාධාරණයට, අසත්‍යයට එරෙහිව හඬ නැගීම, අසත්‍ය පෙන්වා දීම සත්‍යයට හා යුක්තියට සාක්ෂි දැරීමකි. මෙ මගින් භාග්‍ය අට ගෙන හැර දක්වන ඉගැන්වීම් වර්තමාන සමාජය තුළ ජීවත් කළ හැකි ආකාරයකි.

⋆ නිහතමානීව දිවිගෙවීම

සමාජයේදී අපට කෙතරම් උසස් පිළි ගැනීමක් තිබුණත්, අපගේ තනතුරු කොතරම් උසස් වුවත් උඩඟු නොවී බැහැපත්ව නිහතමානීව සියලු දෙනා සමගම සුහදව දිවිගෙවීම මගින් භාග්‍ය අටෙන් අපට දක්වන ඉගැන්වීම් සමාජය තුළ ජීවත් කළ හැකිය.

⋆ සාමය ඇති කිරීමට වෙහෙසීම

සියලුම පුද්ගලයන් සමඟ සාමයෙන් දිවි ගෙවීම මගින්ද වෛරයෙන් පිරි පුද්ගලයන් සිටින තැන්වලට සාමය රැගෙන යාමෙන්ද ජේසුස් වහන්සේ කියාදුන් ඉගැන්වීම වර්තමාන අප ජීවත්වන සමාජය තුළ ක්‍රියාත්මක කළ හැකිය.

⋆ නිතරම දයාව පාමින් දිවිගෙවීම

අසරණ , දුගී , කොන්වී සිටින ජනයා හට සැනසීම දෙමින් ඔවුන්හට දයාව පාමින් දිවි ගෙවීම මගින්ද සමාජය තුළ දයාව පතුරවමින් දිවිගෙවීම මගින්ද භාග්‍ය අට මගින් ගෙනහැර දක්වන ඉගැන්වීම වර්තමාන සමාජය තුළ ක්‍රියාත්මක කළ හැකිය.

⋆ නිර්මල සිත් ඇතිව දිවි ගෙවීම

සමාජයේදී කිසිවෙකුටත් වෛර නොකර, නිහතමානීව පාපී සිතකින් තොරව දිවි ගෙවීමෙන් භාග්‍ය අට මගින් ගෙන හැර දක්වන ඉගැන්වීම් වර්තමාන සමාජය තුළ කළ හැක.

ගරු ඩේමියන් පෙරේරා පියතුමා

## සිසු නායක පදක්කම් පැළැඳවීම

### කෙරවලපිටිය සා. ජෝශප් දහම් පාසල



කෙරවලපිටිය සාන්ත ජෝශප් දහම් පාසලේ 2013 වර්ෂය සඳහා පත් වූ ශිෂ්‍ය නායිකාවන්ට පදක්කම් පැළඳවීමෙන් අනතුරුව මීසම් සේවක ගරු රෝෂන් ප්‍රසාද් පියතුමන් හා ආචාර්ය මණ්ඩලය සමග සමූහ ඡායා රූපයකට මුහුණ දුන් අයුරු.

**සටහන : සිසිල් පෙරේරා / සේයා :- නිහාල් පින්තු**

### කොරළවැල්ල සා. මයිකල් දහම් පාසල



කොරළවැල්ල සාන්ත මයිකල් දහම් පාසලේ ශිෂ්‍ය නායක නායිකාවන්ට පදක්කම් පැළඳවීමේ දිව්‍ය පූජා යාගය අගරදගුරු පදවි කොළඹ දකුණු කලාපීය ධර්මදූත සේවා අධ්‍යක්ෂ ගරු ප්‍රෙඩී ශාන්ති කුමාර් පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. මීසම් සේවක ගරු එරික් මදුරාවල (පැ.තු.නි) පියතුමන්ගේ අනුශාසකත්වයෙන් දහම් ගුරු මණ්ඩලය එක්ව මෙය සංවිධානය කොට තිබුණි. **ලිලන්ති පීරිස්.**

මග්ගොන ජාතික කල්වාරි පුදබිමේදී ''නිමල මරිය දහම් පියස'' කොළඹ සහයක රදගුරු අති උතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පසුගිය ද විවෘත කරන ලදී. එහිදි කළමුල්ල මීසමේ ධර්මදූත ළමා සමාජයේ සාමාජිකාවන් විසින් ඉදිරිපත් කරන ලද විශේෂාංග යේ අවස්ථාවක් ළමා ප්‍රදීප කැමරා කාචයේ සටහන් වූ අයුරු. **ඩී. ඇන්සලම් ප්‍රනාන්දු**





බප/මීග රාගම බැසිලිකා ප්‍රාථමික විදුහලේ සිංහල අලුත් අවුරුදු උළෙල පසුගියදා පැවැත්වුණි. එහි දී දූ දරුවන් අලුත් අවුරුදු චාරිත්‍ර පිළිබඳ දැනුම්වත් කිරීම කැපී පෙණුනි. එහිදී වැඩි හිටියන් නැමදීම නිවැරදිව කිරීමට මග පෙන්වූ ආකාරය ''ළමා ප්‍රදීපය'' කැමරා කාචයේ මෙසේ සටහන් විය. **සී.ආර්. ඩික්සන් ඇන්ටනි**

(පසුගිය සතිය හා සබැඳේ.....)

**14. වර්තමාන ලෝකයේ කිතුනු සභාවන් සහ මූලධර්මවාදී කණ්ඩායම් රැසක් ඇත්තේ කෙසේද? බෙදීම ඇති වුයේ කුමන හේතුන් නිසාද?**

**නොයෙකුත් කාලවලදී විවිධ හේතුන් මත බෙදීම් ඇතිවිය. ඉන් සමහරක් මෙසේය**

iv. කිසියම් සිද්ධියක් හේතුවෙන් ඇතිවූ සභාවන් (උද :- වර්ෂ 1533 දී එංගලන්තයේ සිටි 8 වන හෙන්රි රජතුමන්ට තම බිසව වූ කැතරින් දික්කසාද කර ඇන් බොලින් සමඟ විවාහ වීමට 7 වන ක්ලෙමන්ට් පාප්වහන්සේ අවසර නොදුන් හෙයින් වර්ෂ 1534 දී එම රජුන් ඔහුගේ නායකත්වය යටතේ එංගලන්ත සභාව පිහිටු විය).

v. ශුද්ධ බයිබලය මුළුමනින්ම තම හිතුමතේට වචනාර්ථයෙන් තේරුම්ගැනීම සහ තමන් දෙවියන් වහන්සේ විසින් තෝරාගත් විශේෂ දිවැසිවරයකු ලෙස සිතූ සමහර අය විසින් 19 සහ 20 ශතවර්ෂ වලදී ඇමෙරිකා එක්සත් ජනපදයේ පිහිටුවන ලද කිතුනු මූලධර්මවාදී කණ්ඩායම්.

උදහරණ :-

අ.) ''අනාගත ශුද්ධවරයින්ගෙන් සැදුම්ලත් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ සභාව'' (නොහොත් මෝර්මන්වරු) වර්ෂ 1829 දී ජෝසප් ස්මිත් විසින් පිහිටුවන ලද්දකි.

ආ.) වර්ෂ 1850 දී පමණ විලියම් මිලර් සමග හිරාම් එඩිසන් සහ එලන් වයිට් ආරම්භ කළ සභාව වර්ෂ 1860 දී ''සෙවන්ත් ඩේ ඇඩ්වෙන්ටිස්ට්ස් සභාව'' යනුවෙන් නම් කරන ලදී. වර්ෂ 1844 දී ක්‍රිස්තුන් වහන්සේ ලෝක විනිශ්චය ආරම්භ කළ බවත් දෙවිඳුන් නියම කළ නිවාඩු දිනය සබත මිස ඉරුදින නොවන බවත්, එලන්වයිට් තමන් දුටු යයි පවසන දර්ශන ඇසුරින් ප්‍රකාශ කළාය.

ඇ.) වර්ෂ 1852 දී පෙන්සිල්වේනියාවේ පිට්ස්බර්ග් හි උපත ලැබූ (කොන්ග්‍රිගේෂන් සභාවට අයත් වූ ) චාල්ස් ටේස් රසල් නැමැත්තා වර්ෂ 1872 දී ''මිලේනියල් ඩෝනිස්ට්ස්'' නම් වූ සංවිධානයක් පිහිටුවාගෙන, ක්‍රිස්තුන් වහන්සේගේ දෙවන පැමිණීමේ සුපුවත ලොවට ගෙන එන දිවැසිවරයා වශයෙන් තමන් ව හඳුන්වා ගත්තේ ය. වර්ෂ 1818 දී ''දේවගැති'' යන ගෞරවනීය තනතුරක් රසල් තමාට ම හිමිකරගත්තාට පසුව ඔහුගේ සංවිධානය ආගමික සංවිධානයක් බවට පත්වී වර්ෂ 1879 දී මෙම සංවිධානයේ නම ''මුරටැඹ සමාජය'' යනුවෙන් වෙනස්කරන ලදී. වර්ෂ 1930 දී ''යෙහෝවා : වහන්සේගේ සාක්ෂිකරුවෝ'' යනුවෙන් නැවත වරක් නම වෙනස් කරන ලදී.

ඈ. වර්ෂ 1900 දී ප්‍රර්ම් නමැති දේවගැතිවරයා විසින් තම සිසු පිරිස සමග ''පෙන්තකොස්ත සභාව'' පිහිටුවන ලදී. වර්ෂ 1909 දී ''මූලධර්ම'' යන නම ඇති කාණ්ඩ 12 කින් යුත් විශාල ග්‍රන්ථයක් ඇමරිකාවේ පළ කරනු ලැබිය. මෙම ග්‍රන්ථය මූලධර්ම ව්‍යාපෘතියට බලවත් රුකුලක් විය. පෙන්තකොස්ත සභාව තුළින් බිහිවූ කිතුනු කණ්ඩායම් 30,000 ක් පමණ අද ලෝකය පුරා දක්නට ඇත. මෙම කණ්ඩායම් විවිධ නම් වලින් හඳුන්වනු ලබන අතර, ඇතැම් විට ඒවා එකිනෙකට වෙනස් වූ පරස්පර විරෝධී මතයන් ද ඉදිරිපත් කරති. දිගු කාලීන පැවැත්මක් ද, පැහැදිලි ඓතිහාසික පසුබිමක් ද, ඉගැන්වීමේ නිල අධිකාරයක් ද නැති මෙම කණ්ඩායම් ශුද්ධ ලියවිලි පාඨයන්ට තමතමන්ට රිසි අයුරින් විවිධාකාර අර්ථකථනයන් ඉදිරිපත් කරති. ''ලයිට් හවුස් '' ''එසෙම්බ්ලි ඔෆ් ගෝඩ්'' , ''ස්මරණ'' , ''කල්වාරි'' , ''නව කල්වාරි'' , ''බෙත්ලෙහෙම්'', ''ජීවන ගංගා'' , ''නව ජීවන ගංගා'' සහ ''ජීවන දිය' වැනි කණ්ඩායම් පෙන්තකොස්ත සභාව යටතේ බිහිවී ඇති මූලධර්මවාදී කණ්ඩායම් රාශියකින් සමහරකි.

**15. 16 වෙනි සියවසරේ ඇතිවූ සංශෝධන ව්‍යාපාරය හේතුවෙන් බිහිවූ සම්ප්‍රදායානුකූලව ගොඩනගන ලද කිතුනු සභාවන් අතරින් ශ්‍රී ලංකාවේ දැනට පවතින සභාවන් කවරේද?**

i. ලංකා සභාව (ඇන්ග්ලිකානු සභාව)

ii. මෙතෝදිස්ත සභාව

iii. ඕලන්ද නව සභාව

iv. ප්‍රෙස්බිටේරියානු සභාව

v. බැප්ටිස්ට් සභාව

vi. දකුණු ඉන්දියානු සභාව

vii. ගැලවීමේ හමුදාව

ඉහත සඳහන් සභාවන් මූලධර්මවාදී කණ්ඩායම් නොවන බවත්, එම සභාවන් සමග ශුද්ධවූ සභාව සුහදශීලීත්වයෙන් ක්‍රියා කරන බවත් සඳහන් කළ යුතුය.

# කතෝලික සභාවේ විශිෂ්ටත්වය

**16. ශ්‍රී ලංකාව තුළ දැනට පවතින මූලධර්මවාදී කිතුනු කණ්ඩායම් කීපයක් නම් කරන්න.**

- ★ එසෙම්බ්ලි ඔෆ් ගෝඩ්
- ★ ලයිට් හවුස් සභාව
- ★ අපෝස්තලික සභාව
- ★ බෙතල් සභාව
- ★ කල්වාරි සභාව
- ★ නව කල්වාරි සභාව
- ★ ක්‍රිස්ටියන් එසෙම්බ්ලීස් ඔෆ් ලංකා
- ★ ඩිවයින් ලව් චර්ච්
- ★ ෆෝ ස්කොයැර් ගොස්පල් සභාව
- ★ ජීවන සභාව
- ★ නව ජීවන සභාව
- ★ යෙහෝවා : වහන්සේගේ සාක්ෂිකරුවෝ
- ★ මයි සේවියර් සභාව
- ★ සයන් සභාව
- ★ ෆිලඩෙල්ෆියා සභාව
- ★ රොක් සභාව
- ★ සෙවන්ත් ඩේ ඇඩ්වෙන්ටිස්ට්ස්
- ★ ස්පිරිචුවල් ක්‍රිස්ටියන් ෆෙලෝෂිප්
- ★ ලංකා පෙන්තකොස්ත සභාව
- ★ චර්ච් ඔෆ් ප්‍රෙයා
- ★ ඊස්ට් ලංකා ඉවැන්ජලිකල් මිෂන්
- ★ හවුස් ඔෆ් ප්‍රෙයා සභාව
- ★ ජීවන ගංගා සභාව
- ★ නව ජීවන ගංගා සභාව
- ★ ජීවන දිය සභාව
- ★ ජීසස් කම්ස් ඉවැන්ජලිකල් මිනිස්ට්‍රි
- ★ මොර්මොන්ස් සභාව
- ★ නිව් ලයිෆ් සභාව
- ★ පෙන්ටකොස්ටල් එසෙම්බ්ලි ඔෆ් ශ්‍රී ලංකා
- ★ ප්‍රෙයා ටැබර්නකල් සභාව
- ★ සැන්ක්චුවරි ෆෙලෝෂිප්
- ★ ස්මර්ණ සභාව
- ★ ට්‍රම්පට් සවුන්ඩ් මිනිස්ට්‍රීස්
- ★ බෙත්ලෙහෙම් සභාව
- ★ යුනයිටඩ් ක්‍රිස්ටියන් ෆෙලෝෂිප්

**17. කිතුනු මූලධර්මවාදීන් ඔවුන්ගේ ඇදහිල්ල අනුව ප්‍රධාන කණ්ඩායම් දෙකකට වෙන්කළ හැකිය. ඔවුන් අතර ඇති වෙනස කුමක්ද?**

i. ශුද්ධවූ ත්‍රිත්වය, ක්‍රිස්තුන් වහන්සේගේ දේවත්වය, කන්‍යාවක් වූ මරියතුමියගෙන් එතුමන් උපත ලැබීම , එතුමන්ගේ ශ්‍රී රුධිරයෙහි ඇති ගැලවීමේ බලය, කුරුසිය මත ක්‍රිස්තුන් වහන්සේගේ මරණය, තේජාන්විත උත්ථානය හා උන්වහන්සේගේ නැවත පැමිණීම, සහ ශුද්ධාත්මයාණන්ගේ දේවත්වය හා සභාව තුළ උන්වහන්සේගේ ක්‍රියාකාරිත්වය සමස්ථයක් වශයෙන් පිළිගනිති. (උදා:- පෙන්තකොස්ත සභාව සහ එම සභාව තුළින් බිහිවී ඇති කණ්ඩායම්).

ii. ශුද්ධවූ ත්‍රිත්වය, ක්‍රිස්තුන් වහන්සේගේ දේවත්වය, කුරුසිය මත ක්‍රිස්තුන් වහන්සේගේ මරණය හා තේජාන්විත උත්ථානය, සහ ශුද්ධාත්මයාණන්ගේ දේවත්වය පිළි නොග නිති. (උදා:- යෙහෝවා : වහන්සේගේ සාක්ෂිකරුවෝ).

**18. මෙම කණ්ඩායම් දෙක අතරින් කිතුනු ඉගැන්වීම්වලට වඩාත්ම පටහැනි වන්නේ කුමන කණ්ඩායමද?**

බෙදීගිය මූලධර්මවාදීන්, ශුද්ධ බයිබලය වචනාර්ථයෙන් පමණක් තේරුම්ගන්නා අතර, තමන් විශ්වාස කරන බොහෝ දේ පදනම් කර ඇත්තේ තම නායකයන්ගේ පෞද්ගලික මත අඩංගු ලියකියවිලි මතය. නමුත් මීට අමතරව ඉතාමත් භයංකාර සිදුවීමක් වන්නේ යෙහෝවා: වහන්සේගේ සාක්ෂිකරුවන් තම සභානායකයන්ගේ ව්‍යාජ ඉගැන්වීම් වලට එකඟ වන සේ ශුද්ධ බයිබලයේ නොයෙකුත් පාඨයන් විකෘති කර තමන්ගෙම බයිබලයක් මුද්‍රණය කිරීමයි. (මුරටැඹ සංවිධානය විසින් 1950 දී පමණ සකස් කළ ''නිව් වර්ල්ඩ් ට්‍රාන්ස්ලේෂන් ඔෆ් ද හෝලි ස්ක්‍රිප්චර්ස්'' - එබැවින් කිතුනු ඉගැන්වීම්වලට වඩාත්ම පටහැනි වන්නේ යෙහෝවා: වහන්සේගේ සාක්ෂිකරුවෝ ය.

**ලබන සතියට...**

✍ **වික්ටර් සිල්වා**



# ඉංග්‍රීසි පාඩම විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා

ඉදිරිපත් කිරීම
මයිකල් ඇන්ජලෝ
ප්‍රනාන්දු විසිනි.

පාඩම් අංක : 94

බලන්න ඉහත වැකි වලට **Shall** යෙදීමෙන් අදහස් වෙන්නෙ

- යමක් කළොත් හොඳයි කියන අදහස.
- ඒකට කමක් නැද්ද? කියල අහන අදහස.
- ඒ දේ කිරීමට අවසර පැතීම අනුමැතිය අපේක්ෂා කිරීම සහ
- ඒ දේ කිරීමට තමා කැමැත්තෙන් ඉදිරිපත් වීම පලකෙරෙන අදහස

**මේ ඉහත සඳහන් අදහස් සියල්ලම එකට කැටි කළ විට ලැබෙන අදහස තමයි Shall කියන වචනය යොදල ප්‍රශ්නයක් ඇහුවම මතුවෙන්නෙ.**

අපි දැන් මෙතෙක් කතා කළේ Shall 1 st person (උත්තම පුරුෂ) වලදී භාවිත වන ආකාරය පිළිබඳවයි. උත්තම පුරුෂ භාවිතයේ ප්‍රකාශන වාක්‍ය වලදී (ප්‍රශ්න ඇසීමේදී නොවේ) Shall වෙනුවට Will යෙදීම සමාන අර්ථයක් ගෙන දෙන බැවින් Shall වෙනුවට දැන් බොහෝ විට භාවිත වන්නේ Will බව නැවත මතක් කරගන්න.

අපි ඊ ළඟට "Shall" කියන වචනය 2 nd person (මධ්‍යම පුරුෂ) සහ 3rd person (ප්‍රථම පුරුෂ) සඳහා යෙදෙන හැටි ගැන විමසිලිමත් වෙමු.

"Shall" මෙම 2nd person හා 3rd person වලදී අදහස් කෙරෙන දේට වඩා බෙහෙවින් වෙනස් අදහසක් ප්‍රකාශ වන බව මුලින්ම මතක තබාගන්න.

- I shall go (1st person) - උත්තම
- We shall go (2nd person)
- He shall go (3rd person)
- They shall go (3rd person)

බැලූ බැල්මට එකම වචන යෙදුනට උත්තම පුරුෂ අදහස නෙමේ අනිත් පුරුෂ දෙකෙන් කියැවෙන්නේ. වෙන අදහසක්. අපි ඊළඟට ඒ ගැන විමසා බලමු.

## Will / Shall ගැන තවත් දැනුවත් වෙමු.

1st person වලදී shall යෙදෙන හැටි අපි කතා කළා. මෙහිදී බොහෝ විට Will සහ Shall සමාන අරුත් දක්වන බවත් කතා කළා.

නමුත් 2nd person (මධ්‍යම පුරුෂ) සහ 3rd person (ප්‍රථම පුරුෂ) වලදී Shall යෙදුවොත් ඉන් අදහස් වෙන්නෙ **අණ කිරීමක්, පොරොන්දුවක් හෝ තර්ජනාත්මක** ස්වරයකින් කියන දෙයක් බව මතක තබා ගන්න.

**නිදසුන්:-**

⋆ He ***shall*** not enter my house again.
(හී ෂැල් නොට් එන්ට(ර්) මයි හවුස් අගේන්)
ඔහු මගේ නිවසට ආයෙ ඇතුල් වෙනව එහෙම නෙමේ.. වැනි තර්ජනාත්මක අදහස් ප්‍රකාශ කිරීමක් මෙහිදී සිදුවෙනවා.

⋆ You ***shall*** not kill.
(යූ ෂැල් නොට් කිල්)
මිනී නොමරව (ආඥාවක්, පනතක් වැනි අදහසක්)

⋆ My Soldiers ***shall*** not return without winning the war.
(මයි සෝල්ජර්ස් ෂැල් නොට් රිටර්න් විතවුට් විනිං ද වෝර්)
යුද්ධය දිනන්නෙ නැතිව මගෙ හටයෝ ආපසු එන්නේ නැහැ. (තර්ජනාත්මකව සහ පොරොන්දුවක්, ස්ථිරත්වයක් ඇතිව අදහස් ප්‍රකාශ කිරීමක්)

⋆ You ***shall*** have a holiday tomorrow.
(යූ ෂැල් හැව් අ හොලිඩේ ටුමාරෝ)
ඔබට හෙට නිවාඩුවක් ලැබෙනවා. (පොරොන්දුවක්)

⋆ Ask anything from God. if you ask in faith, you ***shall*** have it.
(ආස්ක් එනිතිං ෆ්‍රොම් ගෝඩ්. ඉන් යූ ආස්ක් ඉන් ෆේත් යූ ෂැල් හැව් ඉට්)
දෙවියන් වහන්සේගෙන් ඕනෑම දෙයක් ඉල්ලන්න. ඔබ විශ්වාසයෙන් ඉල්ලුවොත්, එවිට එය ලැබෙනු ඇත. (පොරොන්දුවක්)

⋆ You ***shall*** be punished for this.
(යූ ෂැල් බී පනිෂ්ඩ් ෆො(ර්) දිස්) මේකට ඔබට දඬුවම් ලැබෙනවා. (තර්ජනාත්මකව අදහස් ප්‍රකාශ කිරීමක්)

1 st person (උත්තම පුරුෂ) වැකි වලදී Shall යෙදූ විට කියැවෙන අදහසට වඩා වෙනස් වූ අදහස් ප්‍රකාශ කිරීමක් 2 nd person (මධ්‍යම පුරුෂ) සහ 3 rd person (ප්‍රථම පුරුෂ) වැකිවලට Shall යෙදූවිට පිළිබිඹු වන බව ඔබට ඉහත වැකිවලින් පැහැදිලි ඇති.

# ක්‍රිස්තියානි කලාවේ අගතැන්පත් කලාකරුවෝ
# කතෝලික සංගීතයේ වර්ධනය 14

### පශ්චාත් රෙපරමාදු ශෛලියේ චිත්‍ර

බොහෝ අවස්ථාවල සුරලොව හා පොළොව යන දෙකම ඔහු එකම චිත්‍රයේ දැක්වූයේ ය. ''ඔර ගාස් සිටුවරයාගේ භූමදානය '' යන ඔහුගේ චිත්‍රය එවැන්නකි. පහත කොටසේ පූජකවරු හා නිලධාරීන් අවටින් බලාගෙන සිටින අතරතුරේ සිටුවරයා භූමදාන කරනු ලබනු දක්නට ලැබේ. උඩ කොටසේ විවෘතවූ අහසක් තුළින් ක්‍රිස්තුන් වහන්සේද මරිය තුමිය හා සාන්තුවරුන්ද ඔහුගේ ආත්මය පිළිගන්නා විලාසය දැක්වේ. යෝග භාවනාවට ලක්වෙන අදහස් කතාවෙන් දැක්විය හැකිනම් එය උසස්ම විධියකට දක්වනු ලැබුණේ එල් ග්‍රේකෝ විසින් ය.

ඔහුගේ කලා ශෛලිය පරම්පරා තුනක ස්පාඤ්ඤ චිත්‍ර කරුවන් විසින් අනුග මණය කරනු ලැබුණේය. එම ශිල්පීන් අතර ''වෙලස්කෙස්'' හා ''මුරිල්ලෝ'' ද වේ . ස්පාඤ්ඤ කලාවේ ශ්‍රේෂ්ඨතම ශතවර්ෂය ඇරඹුණේ එල් ග්‍රේකෝ ගෙන්ය. එහෙත් ජීවිත අවසානය තෙක්ම මයිකල් ආන්ජෙලෝ ගැන ඔහු දැරූ මතය වෙනස් කෙළේ නැත. ඔහු බැලීමට ආ අමුත්තෙකුට වරක් ඔහු පැවසූ පරිදි ''ඔහු හොඳ මිනි හෙක් . නමුත් චිත්‍ර අඳින්ඩ දැන සිටියේ නැහැ.''

ස්පාඤ්ඤය යටතේ වූ නෙදර්ලන්තයේද එම කාලයේදී තවත් විශිෂ්ට චිත්‍රකරුවන් දෙදෙනෙක් වූහ. එක්කෙනෙක් පීටර් පෝල් රූබන්ස්, (1577 - 1640) ය. ඔහු උසස් ගණයේ ආගමික චිත්‍ර රාශියක් නිෂ්පාදනය කළේය. අනික් එක්කෙනා රෙපරමාදු සම්ප්‍රදාය තුළින් බිහිවූ එකම වැදගත් චිත්‍රකරුවා වන රැම්බ්‍රන්ට් වැන්රින් (1606 - 1669) ය. ඔහුගේ චිත්‍ර හා අර්ධ කැටයම් රූබෙන්ස්ගේ ඒවා තරම් ප්‍රදර්ශණ කාර නොවීය. එහෙත් වඩාත් හැඟීම් දනවන සුළු විය.

### පශ්චාත් රෙපරමාදු හෙවත් “බරෝක්” ශෛලියේ ගොඩනැගිලි

ත්‍රිදෙන්තීනු සම්මන්ත්‍රණයෙන් ඇරඹුනු යුගය තුළ ඉතාලියෙන් එතරම් විශිෂ්ට ගණයේ චිත්‍රකරුවෝ නම් බිහිවූයේ නැත. එහෙත් කැටයම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් විශාල සංවර්ධනයක් ඇතිවූයේ ඉතාලිය තුළය.

මෙම යුගයේදී ඉතාලිය තුළ ඉදිකරනු ලැබූ ප්‍රධාන දේවස්ථාන දෙකක් විය. එකක් 1506 දී අරඹා වසර 120 කට පසු 1626 දී නිමකරනු ලබන අතිවිශාල සාන්ත පේදුරු දෙව්මැදුරය. අනික 1568 දී අරඹා වසර 16 කට පසු 1584 දී අවසන් කරන ලද ජේසුයිට් පූජකවරුන්ගේ පළමු දේවස්ථානය වූ 'ගෙසුස්ය' ජේසුස් වහන්සේට කැප කරන ලද්දක් වූ නිසා එය ඉතාලි බසින් කෙටියෙන් 'ගෙසු' නමින් හැඳින්වීය. (එම දේවස්ථානයේ වැඩිපුර සැරසිලි තවත් ශත වර්ෂයක් පුරාම කරගෙන යනු ලැබුණේය.) එහෙත් මේ දෙකෙන් ලොව පුරා පසුකාලීනව වැඩි යන්ම අනුගමනය කරනු ලැබුණේ ''ගෙසු'' නැමති ඒ දෙවෙනි දේවස්ථානය ය. පළමුවැන්න පහසු අනුකරණයට විශාල වැඩිවිය.

''ගේසු'' දේවස්ථානය එතරම් බහුලව අනුගමනය කරනු ලැබීමට තවත් හේතුවක්ද විය. එය අයිතිව තිබුණ ජේසුයිට් පියවරුන්ගේ සංවිධානය අතිශයින් බලවත් වූ එකක් වීමය. එය අරඹන ලද්දේ කලින් ස්පාඤ්ඤ රජයේ හමුදාපති වරයකු වූ ලොයොලාවේ ඉග්නාසියුස් (1491 -1556) විසින් ය.

මාටින් ලූතර් විසින් ක්‍රිස්තියානි ශාසනය දෙකඩ කරනු ලැබූවාට පසු කතෝලික නමින් හැඳින්වුන කොටස ප්‍රතිසංස්කරණය කර ප්‍රතිසංවිධානය කිරීමට පුරෝගාමීව ක්‍රියාකළේ ඔහු විසින් අරඹන ලද ජේසුයිට් පියවරුන්ගේ



සංවිධානය ය. සාන්ත ඉග්නාසියුස් මාටින් ලූතර්ගේ (1472 - 1553) සමකාලිනයකු විය.

සාන්ත ඉග්නාසියුස් කලාවට විශේෂ තැනක් දුන්නේය. ''අධ්‍යාත්මික අභ්‍යාස' නැමති ඔහුගේ පොතේ ඔහු දැක්වූ පරිදි 'අපි දේවස්ථාන ගොඩනැගීම හා සැරසීම පැසසිය යුතුය. පිළිම තැනීමද පැසසිය යුතුය. ඒවායින් නිරූපණය කරන දේ මුල් කරගෙන අපි ඒවාට ගරු කළ යුතුය.' සාන්ත ඉග්නාසියුස්ගේ මරණින් පසු රෝමයේ සිටි ජේසුයිට්වරු ලෝකය පුරාම වූ ජේසුයිට්වරුන්ට ආදර්ශයට ගතහැකි ආකෘතියක් වශයෙන් එම ''ගේසු'' ගොඩනැගිල්ල සැලසුම් කළහ. එය සඳහා මයිකල් ආන්ජලෝගේද සහය ගනු ලැබුණේය. එහෙත් ගොඩනැගිල්ල ඉදිකිරීමට පෙර ඔහු ස්වර්ගස්ථ වූයේය.

**සංස්කාරක පියතුමන් විසිනි**

ඉදිරියට .......



## අන්තිම රාත්‍රී භෝජනය
සිනේජා ආකාර්ෂණී පෙරේරා
01 ශ්‍රේණිය
යහපත් එඬේරා කන්‍යාරාමය - කොළඹ 13

# පුංචි අපේ චිත්‍ර පිටුව



## ප්‍රසාද ස්නාපනය දනය කිරීම
ලිනාරා ප්‍රනාන්දු
04 ශ්‍රේණිය
සාන්ත බ්‍රිජට් කන්‍යාරාමය කොළඹ 07



## සුන්දර පරිසරය
අමන්දි පූර්ණිමා
02 ශ්‍රේණිය
සිරිකුරුස දහම් පාසල - තරාල

පුංචි අපේ චිත්‍ර
පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර,
A4 ( හාෆ්ෂීට් කොලවල ඇඳ )
පාසලේ හෝ දහම් පාසලේ පංති භාර
ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ
නම. පංතිය. පාසල ඇතුළත්ව ඔබේ
පෞද්ගලික
ලිපිනය හා දුරකතන අංකය ද සහිතව
යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.



## දිනයක ඇරඹුම
දෙවන්මා සෙත්නාරා
03 ශ්‍රේණිය
ශු. පවුලේ කන්‍යාරාමය බම්බලපිටිය



## ගොයම් කපන ළඳුන්
හිමංසලා මල්ෂානි
03 ශ්‍රේණිය
නිමල මරියා බාලිකා මහ විදුහල
කුඩැල්ල



## ගිරා රංචුවක්
සිත්මල් උදන සිල්වා
03 ශ්‍රේණිය
ලොයොලා විද්‍යාලය
බෝපිටිය

# ශු. රීටාතුමී (1386 - 1456)



**අම්බ්‍රියාවේ ඇපිනයින් කඳුවැටියේ ගම්වැසියන් වූ රීටාගේ දෙමාපියෝ ස්වාමින් වහන්සේගේ දුක්ප්‍රාප්තියට ගැඹුරු භක්තියක් තිබුණෝය. ගම්වැසියන් ඔවුන් හැඳින්වූයේ ''ජේසුස් ස්වාමින් වහන්සේගේ සාමයේ දූතයන්'' ලෙසය. ඔවුන් තරමක් වයස්ගතවූ විට ඔවුන්ගේ යාච්ඤාවේ ප්‍රතිඵලයක් වශයෙන් දෙවියන් වහන්සේ ඔවුන්ට දියණියක් දනය කළ සේක. ඇය ළදරු කාලයේ සිට සිත් එකඟකරගෙන හුදකලා වීමටත් අනුකම්පාව දැක්වීමටත් කැමති වූවාය.**

ඇයට වයස 18 පමණ වන විට කැසියාවේ පිහිටි අගුස්තීනු නිකායේ තපස් පන්තියට ඇතුළු වීමට සිත් විය. එහෙත් ඇගේ දෙමාපියන් විසින් කෙසේ හෝ ඇය පෝල් පර්ඩිනන්ඩ් නමැති තරුණයාට විවාහ කර දුන්නේය. ඔහු පහසුවෙන් කෝපයට පත් වන දබර කරන අයෙකි. රීටා දෙමාපියන්ගේ කැමැත්ත දේව කැමැත්ත මෙන් පිළිගත්තාය. ඇගේ සැමියා රීටාගේ භක්තියට සරදම් කළේය. ඔහු බීමත්ව පැමිණ ඇයට තලා පෙලා හිරිහැර කළේය. ඇගේ පුත්‍රයන් දෙදෙනා ඈ සමග දිනපතා දිව්‍ය පූජාවට සහභාගී වීම ඇගේ සැනසීමට හේතු විය. ඇය නොකඩවා කළ භක්තිමත් යාච්ඤාද දැඩි තපස් ක්‍රියාද ලෙඩුන් සහ දුගියන් ආදරයෙන් බැහැදැකීමද හේතුකොට ගෙන දෙව්පියාණන් වහන්සේ ඇගේ පුරුෂයාට සම්පූර්ණ සිත් හැරීමක් දනය කළ සේක. අවුරුදු ස්වල්පයකට පසු, කඳුකරයේ මාර්ගයේදී ඔහුට පිහියෙන් ඇන මරා දමා තිබී. ඔහුගේ මෘත ශරීරය සම්භ විය.

රීටාගේ ශෝකය වර්ධනය වූයේ තම පුරුෂයාට ගැලවීම ලද්දේදැයි යන සැකය මතය. එබැවින් තම මර්ධන ක්‍රියා දෙගුණ තෙගුණ කළ ඇය, මුළු හදවතින්ම පුරුෂයාට සදිකම් කළ මිනීමරුවන්ට සමාව දුන්නාය. නමුත් ඇගේ පුතුන් දෙදෙනා ඔවුන් වැඩිවියට පැමිණි විට පියාගේ මිනීමරුවන්ගෙන් පළි ගැනීමට දිව්රුම් දුන්නෝය. ඇය ඔවුන්ට කොතරම් අවවාද කළත් ඔවුන්ගේ අධිෂ්ඨානය වෙනස් නොකළෝය. එබැවින් රීටා දෙවියන් වහන්සේට කන්නලව් කරමින් ඔවුන් මෙවැනි පාපයකට ගොදුරු වීමට පෙර උන්වහන්සේ වෙතට ඔවුන් කැඳවා ගන්නා ලෙස අයැද සිටියාය. ඇගේ යාච්ඤාවට පිළිතුරක් වශයෙන් එම වසර තුළදීම ඔවුහු මරණයට පත්වූහ.

දැන් රීටාට අවුරුදු 30 කි. ඇය අගුස්තීනු නිකායේ තාපසිකාවක් වීමට ඉල්ලා සිටියාය. නමුත් දෙවරක්ම එම ඉල්ලීම ප්‍රතික්ෂේප කෙරිණි. කෙසේ වෙතත් දෙවියන් වහන්සේ ප්‍රාතිහාර්යයක් මගින් උන්වහන්සේගේ කැමැත්ත ප්‍රකාශ කළ සේක.

අගෝස්තු 14 වන දින එනම් දෙව්මව් පරලොවට වැඩි මංගල්‍යයට පෙර දින රාත්‍රියේ ඇය යාච්ඤාවේ යෙදී සිටින විට, ඇය විශේෂ ආදරයක් භක්තියක් දැක්වූ ශුද්ධවන්තයන් එනම් ශු. අගුස්තිනු , ශු. ස්නාවක ජුවාම් සහ ශු. නිකුලස් තුමන් ගේ දොරකඩ දර්ශනය විය. ඔවුන් ඇය කැසියා නුවරට ගෙනගොස් ආරාමයේ දේවස්ථානයේ දිව්‍ය සත්ප්‍රසාද කුඩුව පාමුල තැබීය. රීටා අවංක ලෙස දුන් සාක්ෂිය සත්‍ය බව ඔවුන් පිළිගත්තේ සැම ගෙදරකම අගුල් හොඳකාර වසා තිබූ බැවිනි. එතුමියගේ තාපස කාලය හා වේද භාර ගැනීමට පසු ඇය ඉතා භක්තිවන්ත , චාම් සැඟවුණ ජීවිතයක් වසර 23 ක් එහි ගත කළාය. ඇය ස්වාමින් වහන්සේගේ දුක්ප්‍රාප්තියට සහභාගී වීමට මහත් ආශාවකින් පෙළිණි.

දිනක් ජේසුස් වහන්සේ කටු ඔටුන්නේ කටුවක් ආලෝක රැසක් සමග විත් ඇගේ නළල සිදුරු කළේය. එම තුවාලය සුව වූයේ නැත. එම තුවාලය නිසා වසර 8 ක්ම හුදකළාව තම ආරාමය තුළට වී සිටියාය. 1450 ජුබිලි වසරේදී සියොනාවේ බර්නඩීන්ව ශුද්ධවන්ත කරන දින රෝමයට යෑමට ඉතා ආශාවක් ඈ තුළ තිබිණි. දෙවියන් වහන්සේ ඇගේ තුවාලය සුවකර ඇයට රෝමයට යෑමට ඉඩ දුන් සේක. වයස 64 දී රෝමයට සැතැප්ම 90 ක් දුර ගෙවා පයින්ම ගමන් ගත්තාය.

වසර හතකට පමණ පසු රීටා දෙව් පියාණන් වෙතට ගියාය. ඇගේ මරණින් පසු ගණන් කළ නොහැකි පුදුම සහිත දේ සිදුවිය. ඇය දුෂ්කර කාරණා වලදී ද ජනයාට මැදිහත් වූ නිසා ඇයට දුෂ්කර දේ කිරීමට හැකි ශුද්ධවන්තී යයි නම් කෙරිණි.

**අසේල දසනායක**



## ප්‍රහේලිකා අංක 37

**හරහට**

1. යහපත් සමරිතානු වරයාගේ උපමාවේ සොරුනට අසුවූ මිනිසා ගමන් කරමින් සිටියේ මෙම නගරයටය.

4. යහපත් සමරිතානු වරයා සොරුනට අසුවූ මිනිසා ලඟට ගොස් තෙල් සහ මිදියුෂ ගල්වා ........බැඳ තමාගේ මෘගයා පිට හිඳුවා තානායමට ගෙන ගොස් ඔහු බලා ගත්තේය. මෙහි හිස්තැනට සුදුසු වචනය .

5. තමාට විරුද්ධව පව් කරන සහෝදරයාට කමා විය යුත්තේ මෙපමණක් දක්වා පමණදැයි පේදුරුතුමා ක්‍රිස්තුන් වහන්සේගෙන් ඇසුවේය.

7. ක්‍රිස්තුන් වහන්සේගේ ගෝලයෝ උපවාස නොකරන්නේ මන්දැයි ක්‍රිස්තුන් වහන්සේගෙන් ඇසූ අවස්ථාවේදී ''.......... තමන් සමග සිටියදී ඔහුගේ ඥාති මිත්‍රාදින්ට ශෝක විය හැකිදැයි'' උන්වහන්සේ වදාළ සේක. හිස්තැනට සුදුසු වචනය

10. ලාසරස්තුමාගේ එක් සහෝදරියකගේ නම

**පහළට**

1. ක්‍රිස්තුන් වහන්සේ රාජ තේජසින් මෙම නගරයට වඩිනා විට ''සමිඳුන් නමින් වඩිනා රජුට ආසිරි වේවා'' යි කියමින් මිනිසුන් දෙවියන් වහන්සේට ප්‍රශංසා කළෝය

2. ස්නාවක ජුවාම් තුමා මිනිසුන්ව බව්තීස්ම ස්නාපනය කළේ මේවායින් බවත්, ක්‍රිස්තුන් වහන්සේ පැමිණි පසු ශුද්ධාත්මයාණන්ගෙන්ද, ගින්නෙන්ද මිනිසුන්ව බෞතීස්ම ස්නාපනය කරන බවත් ජුවාම් තුමා ප්‍රකාශ කළේය.

3. කුරුසිය දරාගෙන මා අනුව නොඑන තැනැත්තාට මාගේ ......... විය නොහැකිය'' යනුවෙන් ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. හිස්තැනට සුදුසු වචනය

6. අංශබාග රෝගියාව සුවකර ගැනීම සඳහා ක්‍රිස්තුන් වහන්සේ ඉදිරියට පැමිණෙව්වේ මෙට්ටයක තබා නිවසේ මෙය තුළින් පහලට බැස්ස වීමෙනි.

8. ගෝලයන් සැත්තෑ දෙනාගේ ධර්මදූත මෙහෙය අවසානයේදී ක්‍රිස්තුන් වහන්සේ වෙතට හැරී ආ විට ඔබගේ ......... ස්වර්ගයෙහි ලියා ඇති නිසා සංතෝෂ වන්නැයි ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

9. ක්‍රිස්තුන් වහන්සේ තම දුක් ප්‍රාප්තියට පෙර ගෝලයන්ට කථා කරමින් ''මම ඔබහට සැබෑව පවසමි. මාගේ නික්ම ...... ඔබගේ ශුභ සිද්ධිය පිණිසය'' යි කී සේක. හිස්තැනට සුදුසු වචනය.

**(මෙම ප්‍රහේලිකාව පිරවීමේ දී පහත සඳහන් බයිබල් පාඨ ද උපයෝගී කර ගත හැකිය. ශු. ලූක් 3,5,10,11,14,19 පරිච්ඡේද , ශු. මතෙව් 9, 18 පරිච්ඡේද ශු. ජුවාම් 16)**

**සැකසුම :- තිළිණි දුතිකා පෙරේරා -** කිරිමැටියාගාර

**නිවැරදිව ප්‍රහේලිකාව පුරවා තැපැල් පත් මගින් පමණක්, ප්‍රහේලිකා අංක 37, ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08 යන ලිපිනයට එවන්න.**

# මගේ ජීවිත ගීතයේ තනුව ඔබයි ...



*අහස තරම් දුරක ඉඳන්*
*හීන මවන අම්මේ*
*පොලොව තරම් බර උසුලා*
*දුකවිතරයි වින්දේ*
*නෙතේ කඳුලැල් සිරුරේ*
*දහඩිය සිඳෙනා තුරාවට*
*ජීවිතය සමග අරගල කරමින්*
*අප ඇති දැඩි කළ අම්මේ*
*කඳුළු අතරින් සිනා සී*
*ජීවිතය ජීවත් කරන්නට*
*අපට කියා දුන් අම්මේ*
*මා ඔබෙන් දුර ඇත*
*ජීවත් වුවද ඔබේ ආදරය මා හදේ*
*ජීවත් වනු ඇත*
*සදා කාලයටම*

**ඉන්දික රොෂාන් සොයුරු**
ෆ්‍රැන්සිස්කාන ආධුනිකාරාමය
මග්ගොන


EXIT
පිටවීම

## ශු. ප්‍රැන්සිස් මුණිඳුන්ගේ
කතාව

# අසීසි නගරයේ දිළින්දා

ඉදිරිපත් කිරීම –
ආමල් ද සිල්වා –

**23**




